# කලු ගම්මිරිස් ව්‍යාපෘතිය - ගහලකොලදෙනිය ග්‍රාම නිලධාරි වසම

යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගහලකොලදෙනිය ග්‍රාම නිලධාරී වසම ගම්මිරිස් වගාවේ නිරත ගොවීන් රාශියක් සිටින ග්‍රාම නිලධාරී වසමක් වේ. එහි සිටින ගම්වැසියන් මුහුන දී තිබූ ප්‍රධානතම ගැටලුව වුයේ ප්‍රමිතිගතව ගම්මිරිස් ඇට කරලින් වෙන්කර ගැනීමට තාක්ෂණ ක්‍රමවේදයක් භාවිතා නොකිරීම සහ වැසි කාලයේ දී ගම්මිරිස් නිසි පරිදි වියළා ගැනීමට නොහැකි වීමෙන් ප්‍රමිතිගත කලු ගම්මිරිස් නිෂ්පාදනය කොට අලවි කර ගැනීමට නොහැකි විමයි.

මෙම ගැටලුවට විසඳුම් ලෙස සමාජ ව්‍යවසායකත්ව සංකල්පය භාවිතා කරමින් මෙම ගම්වැසියන් සඳහා උක්ත ව්‍යපෘතිය ක්‍රියාත්මක කරන ලදි.

ගම්මිරිස් කරලින් ඇට වෙන්කිරීම සඳහා මෙම ගොවීන්ට ගම්මිරිස් ඇට ගලවන යන්ත් රයක් හා වැසි කාලයේ දී ද ගම්මිරිස් නියමිත ප්‍රමිතියට වේලා ගැනීම සඳහා විජලන යන්ත්‍රයක් ද ලබාදෙන ලදි. ගම්මිරිස් අවාර කාලයට විජලන යන්ත්‍රය භාවිතා කර කොස්, දෙල්,වම්බටු වැනි දේශීය ඵලවලු බෝග විජලනය කිරීමට සැලසුම් කරන ලදි. ව්‍යාපෘතිය වඩාත් තිරසාරව ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ප්‍රදේශයේ බහුලව තිබෙන පොල් භාවිතා කර පොල්තෙල් නිපදවිම සඳහා කොප්පරා කපන යන්ත්‍රයක් ද ව යාපෘතිය සඳහා ලබාදී තිබෙන අතර ගම්මිරිස් හා කොස් ,දෙල් අවාර කාලයේ දීද කොප්පරා කපන යන්ත්‍රය මගින් කපනු ලබන පොල් විජලන යන්ත්‍රය ආධාරයෙන් වේලා ගෙන තෙල් සිඳීම සිදුකරනු ලැබෙ.

ව්‍යාපෘතිය සඳහා ලබ දී තිබෙන යන්ත්‍ර තුනම ගහලකොලදෙනිය ගැමිදිරිය ප්‍රජා ශාලාවෙ ස්ථානගත කර තිබේ. මෙම ව්‍යාපෘතිය සම්බන්ධව ප්‍රචලිත වීමත් සමග ගහලකොලදෙනිය ග්‍රාම නිලධාරි වසමෙ ගම්මිරිස් වගා කරන ගොවීන්ට අමතරව ප් රාදේශිය ලේකම් කොට්ඨාසයේ අනිකුත් ග්‍රාම නිලධාරී වසම් වල ගොවියන් ද ගම්මිරිස් ඇට කරලින් වෙන් කර ගැනීම හා විජලනය කර ගැනීම සඳහා මෙම ස්ථානයට පැමිණීමට පටන් ගෙන තිබෙ.

යන්ත්‍ර වල නඩත්තු කටයුතු පවත්වාගෙන යාමට හා ජලය ,විදුලිය බිල් පත් ගෙවීම සඳහා අරමුදලක් පවත්වාගෙන යනු ලබන අතර ගම්මිරිස් ඇට ගැලවිම හා විජලනය සඳහා රු. 12/- ක මිළක් හා පොල් කපන යන්ත්‍රය භාවිතා කිරීම වෙනුවෙන් රු.7/- ක මුදලක් ද ආහාර වර්ග විජලනය කිරීම සඳහා රු.7/- ක මුදලක් ද යනා දි ලෙස මුදල් අයකරනු ලැබෙ.

වයි.ජී.එල්. දිල්රුක්ෂි

විද්‍යා හා තාක්ෂණ නිලධාරි - යක්කලමුල්ල